Department of Education. Sabaragamuwa province/Weekly School Department of Education. Sabaragamuwa province/Weekly School Department of Education Sabaragamuwa province/Weekly School



**සකස් කළේ : ඊ. පී. එල්. පතිරණ**
**ර/එල්ලාවල ම. වි.**

නිපුණතාව 7.0 :- මුදල් හා මිල මට්ටම්වල හැසිරීම හඳුනා ගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරීත්වයට බැංකු පද්ධතිය දායක වන ආකාරය විමර්ශනය කරයි.

නිපුණතා මට්ටම 7.4 :- මිල මට්ටම ආශ්‍රිත සංකල්පය, න්‍යාය හා මිනුම් විශ්ලේෂණය කරයි.

භාණ්ඩයක හෝ සේවාවක හෝ මිල හා සම්බන්ධ වැදගත් ස්වරූප තුනකි.

1. නිරපේක්ෂ මිල
2. සාපේක්ෂ මිල
3. පොදු මිල මට්ටම

පොදු මිල මට්ටම ආශ්‍රිත සංකල්ප

1. උද්ධමනය
2. අවධනමය
3. නිරුද්ධමනය

⋆ පොදු මිල මට්ටමෙහි හට ගන්නා අඛණ්ඩ ඉහළ යාම උද්ධමනයයි.
⋆ පොදු මිල මට්ටමෙහි අඛණ්ඩව සිදුවන පහළ යාම අවධමනයයි.
⋆ උද්ධමන අනුපාතයෙහි අගය ක්‍රමයෙන් අඩුවීම නිරුද්ධමනයයි.

උද්ධමනයට හේතු පැහැදිලි කරන න්‍යාය දෙකකි.

1. ඉල්ලුමෙන් ඇදුණු උද්ධමන න්‍යාය
2. පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමන න්‍යාය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටමේ වෙනස්කම් මැනීම සඳහා වර්තමානයේ වැදගත් වන මිල දර්ශක කිහිපයකි.

1. කොළඹ පාරිභෝගික මිල දර්ශකය
2. ජාතික පාරිභෝගික මිල දර්ශකය
3. නිෂ්පාදකයාගේ මිල දර්ශකය
4. දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

ඇගයීම :-

1. ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනයෙහි ප්‍රවේශ 2 නම් කරන්න.
2. උද්ධමනය නිසා ආර්ථිකයට ඇතිවන හිතකර ප්‍රතිවිපාක ලියන්න.
3. උද්ධමනය නිසා ආර්ථිකයට ඇතිවන අහිතකර ප්‍රතිවිපාක 3 ක් ලියන්න.
4. උද්ධමනය පාලනය කිරීම සඳහා යොදා ගත හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග 4 ක් ලියන්න.